―

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2085/23 - 2018 අගෝස්තු මස 24 වැනි සිකුරාදා - 2018.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### දුම්රිය ආඥාපනත

දුම්රිය ආඥාපනතේ (200 පරිච්ඡේදයේ) 03 හා 04 ඒ යන වගන්ති මගින් තමා වෙත පැවරී ඇති බලතල යටතේ මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ප්‍රවාහන අමාත්‍යවරයා විසින් පනවා ඇති ව්‍යවස්ථාව

නිමල් සිරිපාල ද සිල්වා,
ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2018 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ දී ය.

ව්‍යවස්ථා

1926 පෙබරවාරි මස 26 වැනි දින අංක 7514 දරන *ගැසට්පත්‍රයේ* අතිරේකයෙහි පළකරන ලද හා වරින්වර සංශෝධනය කරන ලද මගී ප්‍රවාහනය, පාර්සල්, අශ්වයින්, වාහන සහ සුනඛයින් ප්‍රවාහනය, බඩු සහ සප්‍රාණික සතුන් ප්‍රවාහනය සහ ගාස්තු සහ බඩු වර්ගීකරණය පිළිබඳ රෙගුලාසි 2018 ඔක්තෝබර් 01 වැනි දින සිට තවදුරටත් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

''මගීන් යන ශීර්ෂය යටතේ''

17 වන රෙගුලාසිය - ගාස්තු

*අතුරු ඡේදය -*

(ඒ) සෑම දුම්රිය ස්ථානයක සිට හා / හෝ උපදුම්රිය ස්ථානයක සිට සඳහන් කර ඇති කලාප චක්‍රයට අනුකූලව දක්වා ඇති ගාස්තුව පහත පරිදි සංශෝධනය කෙරේ.

| *ඕනෑම ආරම්භක දුම්රිය/උප දුම්රිය ස්ථානයක සිට* | *මගී කි.මී 1 ට ගාස්තුව* | | |
|---|---|---|---|
| | *I පන්තිය* | *II පන්තිය* | *III පන්තිය* |
| 1 කලාපය කි.මී. 0 සිට කි.මී. 10 දක්වා | 4.20 | 2.30 | 1.30 |
| 2 කලාපය කි.මී. 11 සිට කි.මී. 50 දක්වා | 3.80 | 2.10 | 1.20 |
| 3 කලාපය කි.මී. 51 සිට කි.මී. 100 දක්වා | 3.30 | 1.80 | 1.00 |
| 4 කලාපය කි.මී. 101 සිට කි.මී. 200 දක්වා | 2.50 | 1.40 | 0.80 |
| 5 කලාපය කි.මී. 201 සිට ඔබ්බට | 1.90 | 1.10 | 0.60 |

1A - G 28355 — 507 (2018/08)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(බී) දුම්රිය ස්ථාන දෙකක් හෝ නැවතුම් පොළවල් දෙකක් අතර ගමන් ගාස්තුව පිළියෙල කිරීමේදී ''තුන්වන පන්තියේ ගාස්තුව ආසන්න රුපියල් පහටද, දෙවන පන්තියේ ගාස්තුව ආසන්න රුපියල් දහයටද, පළමු පන්තියේ ගාස්තුව ආසන්න රුපියල් විස්සටද වටයනු ලැබේ'' යන්න නොවෙනස්ව පවතී.

(සී) අවම ගාස්තුව ''පළමු පන්තියේ රුපියල් 40.00 දෙවන රුපියල් 20.00 හා තුන්වන පන්තියේ රුපියල් 10.00'' යන්න නොවෙනස්ව පවතී. වේදිකා ප්‍රවේශපත්‍ර සඳහා දැනට ක්‍රියාත්මක වන රුපියල් 10.00 ගාස්තුවද නොවෙනස්ව පවතී.

09 - 148

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.